# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/15/02/04

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2018.02.16

චක්‍රලේඛ අංක : 2018/03

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල ප්‍රධානීන් වෙත

**2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණි දක්වා සිසුන් ඇතුළත් කිරීමට අදාළ 2008/37 චක්‍රලේඛයේ 06 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධ නව සංශෝධනය.**

පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2008.09.19 දිනැති අංක 2008/37 චක්‍රලේඛයට අමතර වශයෙන් 06 ශ්‍රේණියට පදනම් මත සිසු සිසුවියන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයට අදාළ ව නිකුත් කර ඇති 2008.10.30 දිනැති 2008/37(1) චක්‍රලේඛය අවලංගු කරන අතර මින් ඉදිරියට 2008/37 චක්‍රලේඛයට අමතර වශයෙන් මෙම චක්‍රලේඛයේ උපදෙස් බලපැවැත් වේ.

2008/37 චක්‍රලේඛයේ අංක 4.0 යටතේ හයවන ශ්‍රේණියට සිසු සිසුවියන් ඇතුළත් කිරීම පිළිබඳ උපදෙස්වලට අමතරව 4.8 හා 4.9 ලෙස පහත **2018/03** සංශෝධනයන් ඇතුළත් කරනු ලැබේ.

4.8 අ. ප්‍රාථමික අංශය නොමැති නම් හා නම් කරන ලද පෝෂිත පාසල් නොමැති කල්හි ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ දරුවන්ට, අදාළ පාසලේ දැනට අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන්ට හා පාසල පිහිටි අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනවල සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන්ට ප්‍රමුඛතාවය ලැබෙන පරිදි කණ්ඩායම් තුනටම අනුග්‍රහයක් ලෙස 06 ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා පාසලේ පුරප්පාඩුවලින් 15% ක් ලබාදිය යුතුය. එක් එක් ගණයන් යටතේ හිමි වන ප්‍රතිශතයන් පහත දක්වා ඇති පරිදි විය යුතුය.

| අනු අංකය | ගණය | ප්‍රතිශතය |
|---|---|---|
| 01. | ආදිශිෂ්‍ය | 7.5% |
| 02. | සහෝදර ගණය | 5% |
| 03. | අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් සඳහා | 2.5% |

ආ. අයදුම්කරනු ලබන පාසල 05 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් කඩඉම් ලකුණක් තීරණය වන පාසලක් නම් ඉහත අනුග්‍රහයන් සඳහා ඉල්ලුම් කරනු ලබන සිසු සිසුවියන් ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කයේ අවම ලකුණු සීමාව හෝ ඊට ඉහළ ලකුණු ලබමින් සුදුසුකම් ලබා තිබිය යුතු ය.

ඇ. එසේ වුවද එවැනි පාසලක් සඳහා දිස්ත්‍රික් අවම ලකුණු සීමාව සහිත/ඉක්මවූ සිසු සිසුවියන් ඉල්ලුම් කර/අභියාචනා කර නොමැති අවස්ථාවලදී පමණක් නියමිත අනුග්‍රහ සීමාවන් තුළ පාසලේ තවදුරටත් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අදාළ ගණයන් යටතේ අයදුම් කර ඇති දිස්ත්‍රික් අවම ලකුණු සීමාව නොලැබූ සිසු සිසුවියන් ඉහළ ලකුණු පදනම් මත සලකා බැලිය හැකි ය.

4.9 මෙම 15% අනුග්‍රහය ලැබීමට සුදුසුකම් සහිත ඇති සිසු සිසුවියන්ගේ දෙමව්පියන් විසින් අදාළ පාසලට ඇතුළත් කිරීම සඳහා 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් පාසල් කඩඉම් ලකුණු නිකුත් වී මසක් ඇතුළත තම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එම විදුහලේ විදුහල්පති වෙත යැවිය යුතු ය. විදුහල්පති විසින් එසේ තම විදුහලට ලැබෙන ඉල්ලුම්පත් ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් ලකුණු ප්‍රමුඛතාවය අනුව ගණයන් සඳහා වෙන් වෙන්ව 2008/37 හි අංක 4.7 ට අනුව ලේඛන සකස් කර මෙම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාසල් කටයුතු) වෙත පිටපත් දෙකකින් එවිය යුතු ය. ඒ අනුව තෝරා ගත යුතු සිසුන්ගේ ලේඛනය අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් පාසලට ඉන් පසුව එවනු ඇත.

2008/37 චක්‍රලේඛයේ අංක 4.8 වශයෙන් සඳහන් කර ඇති උපවගන්තිය 4.10 වශයෙන් සැළකිය යුතු ය. ඉහත සඳහන් සංශෝධනයන් හැර අනෙකුත් සියලු ම උපදෙස් 2008/37 චක්‍රලේඛයට අනුකූල විය යුතු ය.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විභාග කොමසාරිස් ජනරාල්
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5. විගණකාධිපති
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම ශාඛා ප්‍රධානීන්